# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
## இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
## HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2023-02-09


පැමිණිලිකරු : එල්.ඒ.කේ. සියඹලාගොඩ මයා,
108/8ඩී, එගොඩවත්ත පාර,
බොරලැස්ගමුව.

වගඋත්තරකරුවන් : 01 පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

02 අධ්‍යක්ෂ,
පොලිස් මානව හිමිකම් කොට්ඨාශය,
නො 07, 07 වන මහල, එන්.එම්.පෙරේරා මාවත,
කොටා ටෙරසය,
කොළඹ 08.

**පැමිණිලි අංකය : HRC/2523/21**

උක්ත පැමිණිලිකරු විසින් ඉහත පැමිණිලි අංකය යටතේ 2021-11-10 දාතමින් ඉදිරිපත් කර ඇති සිය මුල් පැමිණිල්ල සහ පසුව පැමිණිල්ලට අදාළව ඉදිරිපත් කර ඇති අනෙකුත් ලිඛිත සහ වාචික කරුණු දැක්වීම් මගින් ප්‍රකාශ කර ඇත්තේ, තමා 1989 වසරේ උපසේවා උපපොලිස් පරීක්ෂකවරයෙකු ලෙස පොලිස් දෙපාර්තමේන්තුවේ සේවයට බැදී දිවයිනේ විවිධ පොලිස් ස්ථාන වල සේවය කර ඇති බවත්, 2004 වර්ෂයේ ගල්කිස්ස පොලිස් ස්ථානයට අනුයුක්තව සේවය කරමින් සිටියදී රාජකාරිමය වැටලීමක් සම්බන්ධයෙන් තමාට එරෙහිව ඉදිරිපත් කර තිබූ පැමිණිල්ලකට අදාළව වැඩ තහනමට ලක් කළ බවත්ය. ඒ සම්බන්ධයෙන් තමන් විසින් ඉදිරිපත් කර තිබූ අභියාචනය සලකා බැලීමෙන් අනතුරුව 2012-10-30 දින සිට නැවත සේවයේ පිහිටවූ අතර, 'තමන් වැඩ තහනමට ලක්ව සිටි කාලපරිච්ඡේදයට අදාළව ලැබිය යුතු හිග වැටුප් සම්බන්ධයෙන් විනය පරීක්ෂණයෙන් පසු නියෝගය නිකුත් කරන අවස්ථාවේ සලකා බලනු ලැබේ' යැයි සඳහන් කර තිබූ බවත් දක්වා ඇත. නමුත් මේ දක්වා තමන් වෙත අදාළ හිග වැටුප් ලබාදී නොමැති බවත් ඊට හේතුව ලෙස, තමන් පොලිස් උප සේවාවට අයත් නිලධාරියෙක් නිසා එම හිග වැටුප් ලබාදීමට අනුමැතිය ලබාදිය නොහැකි බවට




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office — අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.

සභාපති / தவிசாளர் / Chairman — 011- 2505451

ෆැක්ස් / தொலைநகல் / Fax — 011- 2505541/74

ඊමේල් / மின்னஞ்சல் / e-mail — sechrcsl@gmail.com

දුරකථන

ලේකම්

ක්ෂණික

වෙබ්

වගඋත්තකරුවන් ප්‍රකාශ කර ඇති බවත් දක්වා ඇත. කෙසේ වෙතත් පොලිස් උප සේවාවට අයත් නිලධාරීන් කිහිප දෙනෙකුටම විනය පරීක්ෂණවලින් පසුව නැවත සේවයේ පිහිටුවීමේදී අදාළ හිඟ වැටුප් ලබාදී ඇති බැවින් තමා පමණක් මෙහිදී අසමාන සැලකිල්ලකට භාජනය කර ඇති බවත්, එම තත්වය තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වගන්තිය මගින් සහතික කර දී ඇති සමානයින් අතර අසමාන සැලකිලි දැක්වීම නොකළයුතුය යන වගන්තිය උල්ලංඝනය කරමින් කටයුතු කර ඇති බවත්, ඒ සම්බන්ධයෙන් ලිඛිත සාක්ෂි ඉදිරිපත් කිරීමට හැකියාව ඇති බවත් ප්‍රකාශ කරමින් ඒ සම්බන්ධව පරීක්ෂණයක් සිදු කර සහනයක් සලසා දෙන ලෙස ඉල්ලා ඇත.

**වගඋත්තරකරුවන්ගේ කරුණු සැළ කිරීම =:**

පැමිණිල්ලට අදාළව 2022-10-17 දාතමින් පොලිස්පතිවරයා වෙනුවෙන් කරුණු ඉදිරිපත් කර ඇති අධ්‍යක්ෂ, පොලිස් මානව හිමිකම් කොට්ඨාශය ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකාර පොලිස් නිලධාරියාට විරුද්ධව ලද පැමිණිල්ලක් හේතුවෙන් 2004-05-12 වන දින සිට වැඩ තහනමට ලක්ව 2012-10-30 වන දින සිට චෝදනා පත්‍රයක් සහිතව නැවත සේවයේ පිහිටුවා ඇත. නැවත සේවයේ පිහිටුවා එම චෝදනා පත්‍රය සඳහා විනය පරීක්ෂණයක් පවත්වා විනය නියෝග නිකුත් කර ඇති අතර, එහි දී පැමිණිලිකරු සියළු චෝදනා වලට නිවැරදිකරු බවට තීරණය කර ඇති අතර වැඩ තහනම් කර තිබූ කාල පරාසයට හිමි හිඟ වැටුප් හෝ කිසිදු දීමනාවක් නොගෙවීමට විනය නියෝගයෙහි සඳහන් කර ඇති බවද දක්වා ඇත.

**විමර්ශනය =:**

මෙම පැමිණිල්ලට අදාළව සිදු කර ඇති විමර්ශනයේදී දෙපාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති ලිඛිත සහ වාචික කරුණු දැක්වීම් පිළිබඳව අවධානය යොමු කිරීමේදී, පොලිස් දෙපාර්තමේන්තුවේ ඉහළ නිලධාරීන් තමන් සම්බන්ධයෙන් ද්වේශ සහගත ලෙස කටයුතු කරමින් අවස්ථා ගණනාවකදී පළිගැනීමේ චේතනාවෙන් තමන්ගේ වැඩ තහනම් කිරීම් සහ ස්ථාන මාරු කිරීම් සිදු කර ඇති බවත්, ඒ ඒ අවස්ථා වලදී තමන් විසින් අභියාචනා ඉදිරිපත් කිරීම මගින් සහන සලසා ගෙන ඇති බවත්, කෙසේ වෙතත් 2004 වර්ෂයේ වැඩ තහනමට ලක්ව සිටීමෙන් පසුව නැවත සේවයේ පිහිටුවා ඇති අතර, එම වැඩ තහනමට ලක්ව සිටි කාලයට අදාළ හිඟ වැටුප් සහ දීමනා තමන් වෙත හිමිවිය යුතු බවත්, එම හිඟ වැටුප් ලබාදීමට හැකියාවක් නැත්තේ තමන් පොලිස් උප සේවයේ නිලධාරියෙකු නිසා බව වගඋත්තරකාර පාර්ශවය සඳහන් කර ඇතත්, තමන් මෙන්ම පොලිස් උප සේවා රාජකාරි වල නිරතව සිටි නිලධාරීන් කිහිප දෙනෙකුටම මේ ආකාරයට විනය පරීක්ෂණ වලින් පසුව සේවයේ පිහිටුවීමෙන් අනතුරුව අදාළ හිඟ වැටුප් සහ දීමනා ගෙවා ඇති බවත් පැමිණිලි පාර්ශවය විසින් සාක්ෂි සහිතව කරුණු ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව පැමිණිලිකරු ප්‍රකාශ කරන පරිදි පොලිස් උප සේවයේ යෙදී සිටියදී විනය පරීක්ෂණ සිදු කළ පසුව එම විනය පරීක්ෂණ අවසානයේ නිවැරදිකරු වූ ඇතැම් නිලධාරීන්ට වැඩ තහනම් කාලය තුළ හිග වැටුප් සහ දීමනා ලබාදී ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව එකම දෙපාර්තමේන්තුවේ සේවය කර ඇති නිලධාරීන් දෙදෙනෙකු සම්බන්ධයෙන් පොලිස් දෙපාර්තමේන්තුව වෙනස්ව සලකා ඇති බව නිරීක්ෂණය වේ.

**නිගමනය =:**

මෙම පැමිණිල්ල සම්බන්ධව සිදු කර ඇති විමර්ශනයේදී අනාවරණය වී ඇති කරුණු අනුව වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිලිකරු වෙත 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් හිමි කරදී ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන ආකාරයෙන් කටයුතු කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ..

**නිර්දේශය :-**

ඒ අනුව, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් වගඋත්තර පාර්ශවය විසින් උල්ලංඝනය කර ඇති බවට අනාවරණය වී ඇති බැවින්, පැමිණිලිකරු සිය පැමිණිල්ල මගින් අයැද සිටින සහනය වන වැඩ තහනමට ලක්ව සිටි 2004-05-12 සිට 2012-10-30 දින දක්වා කාලය සඳහා වන හිග වැටුප් සහ දීමනා ලබා දියයුතු බවට පොලිස්පතිවරයා වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023. 04 . 18 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධ පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර. එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ම.හේ. නිමල් කරුණාසිරි.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

B/

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka